museum of modern
and contemporary art
sri lanka

## Quarterly Newsletter #13 – March 2025

### ‘සිලෝනයේ කවි තුනක්’

**‘සිලෝනයේ කවි තුනක්’** නම් ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) නවතම ප්‍රදර්ශනය ජනවාරි 23 සිට පෙබරවාරි 11 දක්වා කොළඹ 2, පාර්ක් ස්ට්‍රීට් මියුස්හි, ද ස්ටේබල්ස් හිදී විවෘතව පැවතුනි. උතුරු, නැගෙනහිර, සහ බස්නාහිර පළාත්වල පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන නවයක සිසුන් 460ක් ඇතුළු නරඹන්නන් 2,015ක් මෙම ප්‍රදර්ශනට සහභාගී විය.

‘සිලෝනයේ කවි තුනක්' **තිනාල් සජීව** සහ **නිමායා හැරිස්**ගේ සහාය ඇතිව **සන්දේවි හැන්ඩි** විසින් අභිරක්ෂණය කරන ලදී. එහි ආරම්භක ලක්ෂ්‍යය වන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ ලංකා තේ ප්‍රචාරණ මණ්ඩලය විසින් නිර්මාණය කෙරුණු ‘The Song of Ceylon’ (1934) චිත්‍රපටයයි. ඉන්පසු ගතවූ දශකවල කලාකරුවන් දෙදෙනෙකු මෙම චිත්‍රපටිය වෙනස් දෘෂ්ටි කෝණවලින් නැවත නැරඹූ ආකාරයත්, ඒ දෙදෙනාම එයට ප්‍රතිචාරයක් වශයෙන් විකල්ප ‘ගීතයක්’ නිෂ්පාදනය කල ආකාරයත් මෙම ප්‍රදර්ශනය නිරීක්ෂණය කරයි. 'සිලෝනයේ කවි තුනක්' ප්‍රදර්ශනය මෙම සෑම සිලෝනයේ ගීතයක් ම සමකාලීන කලාකරුවන්ගේ මෑත කාලීන චලන රූප කෘති සමඟ සංවාදයකට ගෙන ඒමෙන්, චලන රූප මාධ්‍යය යොදාගෙන කතා කියන, කතා නැවත කියන, සහ කතා අස්ථාවර කරන ආකාරය මෙම ප්‍රදර්ශනය ගවේෂණය කරයි.

‘සිලෝනයේ කවි තුනක්' ශ්‍රී ලංකාව, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රේලියාව, එක්සත් ජනපදය පුරා සිටින කලාකරුවන්ගේ කලාකෘති ප්‍රදර්ශනය කළේය. එයට, බානි අබිදි (උ.1971), ඉමාද් මජීද් (උ.1991) සහ ශරිකා නවමනි (උ.1990), ලලීන් ජයමාන්න (උ.1947), ලයනල් වෙන්ට් (1900–1944) සමග ජෝන් ග්‍රියර්සන් (1897–1972), වෝල්ටර් ලේ (1905–1942), සහ බැසිල් රයිට් (1907–1987), මාර්ක් ලපෝර් (1952–2005), සහ රොසලින්ඩ් නශශිබිගේ (උ.1973) ඇතුළත් ය.

### Countdown 1-Minute Film Night

‘සිලෝනයේ කවි තුනක්' හි කොටසක් ලෙස, **Countdown 1-Minute Film Night** චිත්‍රපට රාත්‍රියේ දෙවන වටය පෙබරවාරි 7 දින **කොළඹ බෙයාෆුට් ගැලරිය** හා සහයෝගීව අපි ඉතා උද්යෝගයෙන් සංවිධානය කළෙමු. චලන රූප සහ වීඩියෝ කලාව යන ආකෘති අත්හදා බලන කලාකරුවන් සහ නිර්මාණශීලී වෘත්තිකයන්ගේ මිනිත්තුවක චිත්‍රපට ඇතුළත් මෙම දර්ශනය, කෙළිලොල් බව, විනය, සහ කලාත්මක අවදානම් ගැනීම සඳහා වූ අවකාශයක් ලෙස කෙටි චිත්‍රපටකරණයට ඇති විභවය සැමරුවේ ය. මෙහිදී 60 අධික නිර්මාණ අතරින් තෝරාගත් චිත්‍රපට 30 ඉදිරිපත් කෙරුණි. තරඟයට සහභාගී වූ සියලු නිර්මාණශීලීන්ට අපගේ සුබ පැතුම්!

### ලෝක ස්මාරක අරමුදල සහ වාස්තු විද්‍යාඥ ඉතිහාසඥයන්ගේ සංගමයේ සංචාර

ජාත්‍යන්තර සගයන් සමඟ අපගේ සහයෝගීතා ව්‍යාප්ත කරමින් **ලෝක ස්මාරක අරමුදලේ** අනුග්‍රාහකයෝ සහ **වාස්තු විද්‍යාඥ ඉතිහාසඥයන්ගේ සංගමයේ** සාමාජිකයෝ 2025 නොවැම්බර්

සහ දෙසැම්බර් හිදී MMCA ශ්‍රී ලංකා වෙත පැමිණියහ. එහිදී MMCA ශ්‍රී ලංකා ආකයිව කණ්ඩායම සමඟ ඔවුන්ගේ නව ලැයිස්තුගත කිරීම් සහ ඩිජිටල්කරණ ප්‍රයත්නවල වර්ධනයන් පිළිබඳව කතා කිරීමට ඔවුන්ට අවස්ථාවක් ලැබුණි.

**යාපනයේ පැවැත්වුණු Pop Art and South Asia සම්මේලනය**

2025 දෙසැම්බර් 16 වන දින යාපනයේ පැවැත්වුණු **Pop Art and South Asia Conference** (පොප් කලාව සහ දකුණු ආසියා සමුළුව) හිදී ජ්‍යෙෂ්ට අභිරක්ෂක **සන්දේව් හැන්ඩි** සහ ව්‍යාපෘති අභිරක්ෂක **නිමායා හැරිස්** ලිපියක් ඉදිරිපත් කළහ. **'On the Possibilities of Pop: Testing Frameworks from Sri Lanka'** නම් ඔවුන්ගේ පර්යේෂණ ලිපිය ශ්‍රී ලාංකික සමකාලීන කලාවේ නව ප්‍රවර්ධන ගවේෂණය කළේ, ඉෆ්තිකාර් ඩාඩි සහ රූබිනා කරෝඩේ විසින් අභිරක්ෂණය කළ 'Pop South Asia' නම් සුවිශේෂ ප්‍රදර්ශනයේ ඉදිරිපත් කළ දකුණු ආසියාවේ පොප් ආර්ට් සම්ප්‍රදාය ඇසුරිනි.

**Primer Southeast Asia**

මෙම වසරේ අප කණ්ඩායමේ ඉගෙනුම් කටයුතු ආරම්භ කරමින්, ප්‍රධාන අභිරක්ෂක **ශාර්මිණී පෙරේයිරා** ජනවාරි 25 සිට 30 දක්වා **Primer Southeast Asia** වැඩසටහනට සහභාගී වූවා ය. **සිංගප්පූරු ජාතික ගැලරිය** විසින් සංවිධානය කරන ලද, ආරාධිත අයට පමණක් සහභාගී විය හැකි මෙම වැඩසටහන, අග්නිදිග ආසියාවෙන් පිටත ක්‍රියාකරන අභිරක්ෂකයින්ට කලාපයේ නූතන හා සමකාලීන කලා සන්දර්භ පිළිබඳව අත්‍යවශ්‍ය දැනුමක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. කලාකරුවන්, අභිරක්ෂකයින්, සහ අනෙකුත් කලා වෘත්තිකයන් සමඟ සමීප සාකච්ඡාවල යෙදෙමින්, සිංගප්පූරුවේ සහ ඉන්දුනීසියාවේ ජකර්තා සහ බන්ඩුං නගරවල කලාකරුවන්ගේ චිත්‍රාගාර, ප්‍රදර්ශන, සහ කෞතුකාගාර නැරඹීමට පෙරේයිරාට අවස්ථාව ලැබුණි.

**2025 සිංගප්පූරු බියනාලේ හිදී 'Boxes, Borders, Biji, Cipta'**

'**Singapore Biennale 2025: pure intention'** හා සමගාමීව මාර්තු 22 සිංගප්පූරු කලා ගැලරියෙහි පැවැත්වුණු 'Boxes, Borders, Biji, Cipta' යන සැසියේදී ද ශාර්මිණී පෙරේයිරා කතා කළාය. CAMP විසින් නිර්මාණය කරන ලද 'Metallic Container' (2025) කලා කෘතියෙන් ආභාෂය ලැබූ කථිකයන් පුළුල් මැලේ ලෝකය, ද්‍රව්‍යමය ඉතිහාසයක් ලෙස ආහාර, සහ ආඛ්‍යාන මෙවලමක් ලෙස 'දේශසීමාව' ගවේෂණය කළහ.

**කෝචි බියනාලේ පදනම විසින් පැවැත්වූ ප්‍රදර්ශන-වැඩමුළුව**

පෙබරවාරි 9 සිට 13 දක්වා **කෝචි බියනාලේ පදනම** විසින් කේරලයේ ෆෝර්ට් කොචි හි පැවැත්වූ **ප්‍රදර්ශන-වැඩමුළු අභිරක්ෂක තීව්‍රයට** (Exhibition–Workshop curatorial intensive) **නිමායා හැරිස්** සහභාගී වූවා ය. මෙම දින හතක වැඩසටහන තරුණ අභිරක්ෂකයන්ට සමකාලීන අභිරක්ෂණ ක්‍රියාවලියේ විවේචනාත්මක කතිකාවල් සහ ක්‍රමවේද සමඟ සම්බන්ධ වීමට ඇති සහයෝගී වේදිකාවක් විය. South About Conference නම් සමුළුවට මෙන් ම අභිරක්ෂක සැසි හයක මාලාවකට ද සම්බන්ධ වුණු හැරිස්, ඉන්පසු කෝචි-මුසිරිස් බියනාලේහි (Kochi-Muziris Biennale) සංචාරයක නිරත වූවා ය.

**ආකයිව ඩිජිටල්කරණය කිරීමේ පුහුණුව**

ආකයිවකරණය පිළිබඳව අපගේ කණ්ඩායමේ පුහුණු ප්‍රයත්න ඉදිරියට ගෙන යමින්, **අධිලේඛනාරක්ෂක නයිජල් නුගවෙල** විසින් MMCA ශ්‍රී ලංකා ආකයිව සහ එකතු කිරීමේ කණ්ඩායම් සඳහා ආකයිවයක විවිධ වර්ගයේ වාර්තා ඩිජිටල්කරණය කිරීම පිළිබඳ සැසියක් පවත්වන ලදී. පෙබරවාරි 16 පැවති මෙම පුහුණුවට ව්‍යවහාරයේ ආචාර ධර්ම සහ ඩිජිටල්කරණ ක්‍රියාවලියක මූලික කොටස්වල සිට, ඩිජිටල්කරණයේ තාක්ෂණික හා ප්‍රායෝගික කොටස් දක්වා වූ ඩිජිටල්කරණය කිරීමට අයත් සියලු අංශ ඇතුළත් විය.

**Curatorial Intensive South Asia**

සහාය අභිරක්ෂක **තිනාල් සජීව,** Goethe-Institut සහ Max Mueller Bhavan හි සහයෝගය සමඟ Khoj ජාත්‍යන්තර කලාකරුවන්ගේ සංගමය විසින් පැවැත්වූ **Curatorial Intensive South Asia (CISA)හි** හත්වන සංස්කරණයට සහභාගී වී එහි සිය පුහුණුවීම් සාර්ථකව අවසන් කළේ ය. එමෙන් ම, මාර්තු 12 වන දින නව දිල්ලියේදී CISA විසින් පැවැත්වූ 'When We Return' ප්‍රදර්ශන මාලාවේ කොටසක් ලෙස ඔහු සිය පළමු ඒකල අභිරක්ෂක ව්‍යාපෘතිය වන **'as needed'** විවෘත කළේ ය.

**MMCA ශ්‍රී ලංකා අනුග්‍රාහකයින් කෝචි-මුසිරිස් බියනාලේ (Kochi-Muziris Biennale) නරඹයි**

කොචි වෙත වූ ආදි කර්තෘ අභිරක්ෂක කලා සංචාරය පෙබරවාරි 26 සිට මාර්තු 1 දක්වා පැවැත්වුණ අතර එයට කෝචි-මුසිරිස් බියනාලේහි මඟ පෙන්වන සංචාර ඇතුළත් විය. මෙම වැඩසටහනට ප්‍රදර්ශන ස්ථාන කිහිපයක් සහ සිසුන්ගේ බියනාලේ වෙත සංචාර ඇතුළත් විය.

**Desi Art Mag ප්‍රකාශයට පත්කරන 'Building a Museum Without a Blueprint'**

අවසාන වශයෙන්, MMCA ශ්‍රී ලංකා පිළිබඳ ලියවුණු ලිපියක් **Desi Art Mag** හි නවත ම ප්‍රකාශනයේ පළවී තිබෙන අතර, එහි නම්රතා දේවන්ජී විසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය ඉදි කිරීමේ අභියෝගාත්මක නමුත් ඵලදායී කර්තව්‍ය පිළිබඳව ශාර්මිණී පෙරේයිරා සමඟ කතා කරයි. 'Building a Museum without a Blueprint' Desi Art Magහි බ්ලොග් පිටුවේ දෙමළ, සිංහල, සහ හින්දි මාධ්‍යයෙන් ද ඇත.